**ශ්‍රී ජයවර්ධනපුර කලාප අධ්‍යාපන කාර්යාලය**
**(25) ශ්‍රී ලංකාවේ ඉතිහාසය**
**13 ශ්‍රේණිය**
**දෙවන වාර පරීක්ෂණය-2019**
**(ඈත අතීතයේ සිට ක්‍රි.ව.1978 දක්වා)**

11 පත්‍රය (2කොටස) කාලයː පැය 03

සැලකිය යුතුයි.

- **පළමුවන ප්‍රශ්නය අනිවාර්යය වේ.**
- **B හා C කොටස්වලින් එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න එක බැගින් තෝරාගෙන ප්‍රශ්න තුනකට පිළිතුරු සපයන්න.**

---

(පළමුවන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම සඳහා ඉන්දියාවේ දළ සිතියමක් සපයා ඇත.

**A කොටස**

1) ඔබට සපයා ඇති සිතියමෙහි පහත සඳහන් සියලුම ස්ථාන ලකුණු කොට නම් කරන්න.

| | | |
|---|---|---|
| I) මිහිතාගල්කන්ද | ii) ගම්පොළ | iii) මහියංගනය |
| iV) සීතාවක | V) කුරුණෑගල | Vi) උතුරු පළාත |
| Vii) පල්ලවංක | Viii) කදම්බ නදී | i×) දේවනගර |
| ×) කල්පිටිය | ×i) ජම්බුකෝලපට්ටන | ×ii) අනුරාධපුරය |

(ල 1×12)

**B කොටස**

2) මහසෙන් රාජ්‍ය සමයේ අවසානය තෙක් ශ්‍රී ලංකාවේ ඉතිහාසය හැදෑරීමෙහිලා පාලි වංශකථාවල ඇති වැදගත්කම පරීක්ෂා කරන්න.

(ල.16)

3) "පළමුවන විජයබාහු රජතුමා පොළොන්නරු යුගයේ සිටි ශ්‍රේෂ්ඨ නරපතියෙකි." මේ කියමන සාකච්ඡා කරන්න.

(ල.16)

4) අනුරාධපුර රාජධානියේ පරිහානියට හා බිඳවැටීමට තුඩු දුන් ප්‍රධාන සාධක විචාරාත්මකව විමසන්න.

(ල.16)

5) පහත සඳහන් මාතෘකා අතුරෙන් ඕනෑම දෙකක ඓතිහාසික වැගදත්කම පිළිබඳව කෙටි සටහන් ලියන්න

I. පුරාවිද්‍යා මූලාශ්‍රවල වැදගත්කම
II. පූර්ව ඓතිහාසික යුගයේ තාක්ෂණය
III. අනුරාධපුර යුගයේ වාරිකර්මාන්තයේ වර්ධනය
IV. කෝට්ටේ යුගයේ සාහිත්‍යය
V. රජරට සමයේ දකුණු ඉන්දියාවෙන් එල්ල වූ ආක්‍රමණ (ල.8×2=16)

## C කොටස

6) ශ්‍රී ලංකාවේ මුහුදුබඩ පළාත්වල ලන්දේසීන් විසින් අනුගමනය කරන ලද ආර්ථික ප්‍රතිපත්තියේ ප්‍රධාන ලක්ෂණ පරීක්ෂා කරන්න.

(ල.16)

7) උඩරට රාජධානියේ බිඳවැටීමට තුඩුදුන් සාධක විචාරාත්මකව විමසන්න.

(ල.16)

8) දහනවවන සියවසේ දෙවන භාගයේ ආගමික පුනර්ජීවන ව්‍යාපාරය පිළිබඳ හැඳින්වීමක් කරන්න.

(ල.16)

9) පහත සඳහන් මාතෘකා ඇසුරින් ඕනෑම දෙකක ඓතිහාසික වැදගත්කම පිළිබඳව කෙටි සටහන් ලියන්න.

I. ලන්දේසීන් හා උඩරට අතර පැවති සම්බන්ධතා
II. කෝල්බෲක් ප්‍රතිසංස්කරණ
III. පෘතුගීසීන් උඩරට රාජ්‍යයේ බලය ලබා ගැනීමට ගත් උත්සාහයන්
IV. 11 වන රාජසිංහ රජු

(ල.8×2=16)

**ශ්‍රී ජයවර්ධනපුර කලාප අධ්‍යාපන කාර්යාලය**
**(25) ශ්‍රී ලංකාවේ ඉතිහාසය**
**13 ශ්‍රේණිය**
**දෙවන වාර පරීක්ෂණය-2019**
**(ඈත අතීතයේ සිට ක්‍රි.ව.1978 දක්වා)**

1 පත්‍රය (1කොටස) කාලයः පැය 03

සැලකිය යුතුයි.

- සියලුම ප්‍රශ්න වලට පිලිතුරු සපයන්න
- නිවැරදි හෝ වඩාත්ම ගැලපෙන හෝ පිළිතුර තෝරන්න

---

අංක 01 සිට 100 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නම් පහ බැගින් දී ඇත. ඒවා අතුරෙන් එකක් පමණක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමග නොගැළපේ. එම නොගැලපෙන නම කුමක්දැයි හඳුනාගෙන එහි අංකය වරහන තුළ ලියන්න.

01) (1) ඔනෙසික්‍රිටස් (2) මෙගස්තිනිස් (3) ප්ලිනි
(4) කොස්මස් (5) වෙංහෝ (...............)

02) (1) තැප්‍රෙබේන් (2) පලෙසිමුන්ඩු (3) සෙරන්ඩිබ්
(4) ජනනාථ මංගලම් (5) සෙයිලාන් (...............)

03) (1) සේනගුත්තික (2) අසේල (3) එළාර
(4) බුද්දපාරින්ද (5) මාඝ (...............)

04) (1) පරාක්‍රම සමුද්‍රය (2) කවුඩුලු වැව (3) ගිරිතලේ වැව
(4) කන්තලේ වැව (5) මින්නේරි වැව (...............)

05) (1) අදිකාරම් (2) කෝරාළ (3) දිසාවේ
(4) ඔව්දෝර් (5) රටේ මහත්තයා (...............)

06) (1) 1 වැනි රාජසිංහ (2) විජය රාජසිංහ (3) කීර්ති ශ්‍රී රාජසිංහ
(4) රාජාධි රාජසිංහ (5) ශ්‍රී වික්‍රම රාජසිංහ (...............)

07) (1) දන්තුරේ සටන (2) වෙල්ලස්ස සටන (3) බලන සටන
(4) රන්දෙනිවල සටන (5) ගන්නෝරුව සටන (...............)

08) (1) කෝල්බෲක් - කැමරන් (2) කෲ - මැකලම් (3) මොන්ටෙගු - වෙමස්ෆර්ඩ්
(4) මැනිං - ඩෙවොන්ෂයර් (5) ඩොනමෝර් (...............)

09) (1) ජෝන් ඩොයිලි (2) ජෝර්ජ් ටර්නර් (3) ජෝර්ජ් බර්ඩ්
(4) ජේම්ස් එමර්සන් ටෙනන්ට් (5) ලෙනාඩ් වුල්ෆ් (...............)

10) (1) ආනන්ද විද්‍යාලය (2) රාජකීය විද්‍යාලය (3) ධර්මරාජ විද්‍යාලය
(4) හින්දු විද්‍යාලය (5) සහිරා විද්‍යාලය (...............)

අංක 11 - 15 ප්‍රශ්නවලට පද යුගල පහ බැගින් දී ඇත. ඒ අතුරින් එක යුගලයක පද එකිනෙකට නොගැළපේ. එම නොගැළපෙන යුගලය කුමක්දැයි හඳුනාගෙන ඊට අදාළ අංකය වරහන් තුළ ලියන්න.

11) (1) වංසත්ථප්පකාසිනී - මහාවංසයේ ටීකාවයි
(2) සදලකුණ - පොළොන්නරු යුගයේ ව්‍යාකරණ ග්‍රන්ථයකි
(3) පූජාවලිය - අරහං බුදු ගුණය විස්තර කර ඇත
(4) කව්සිළුමිණ - මඛාදේව ජාතකය ඇසුරින් රචිතය
(5) සරජෝතිමාලෙ - ද්‍රවිඩ ජෝතිශ්‍ය ග්‍රන්ථයකි

(.................)

12) (1) කව්සිළුමිණ - 11 පරාක්‍රමබාහු
(2) සමන්තපාසාදිකාව - බුද්ධඝෝෂ හිමි
(3) මහාවංශය - මහානාම හිමි
(4) සීතාවක හටන - රාජසිංහ රජු
(5) ජානකීහරණය - කුමාර ධාතුසේන රජු

(.................)

13) (1) කාවන්තිස්ස - විහාරමහා දේවි
(2) 1 විජයබාහු - තිලෝකසුන්දරී
(3) 1 පැරකුම්බා - රත්නාවලී
(4) නිශ්ශංකමල්ල - කල්‍යාණවතී
(5) වලගම්බා - සෝමාදේවි

(.................)

14) (1) ලෝපේස් ද සූසා - 1 වන විමලධර්මසූරිය රජ
(2) කොන්ස්තන්තිනුද සා - සෙනරත් රජු
(3) ලෝරන්ස් පීල් - 11 විමලධර්මසූරිය
(4) විලේම් බැරන් ඉම්හොප් - නරේන්ද්‍රසිංහ රජු
(5) ෆන් එක් - ශ්‍රී වික්‍රම රාජසිංහ රජු

(.................)

15) (1) අනගාරික ධර්මපාල - මහාබෝධි සමාගම
(2) ඩී.බී.ජයතිලක - තරුණ බෞද්ධ සංගමය
(3) හෙන්රි ස්ටීල් ඕල්කට් - පරම විඥානාර්ථ සමාගම
(4) හික්කඩුවේ සුමංගල හිමි - විද්‍යාලංකාර පිරිවෙන
(5) මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි - පානදුරා වාදය

(.................)

අංක 16 සිට 20 වන තෙක් එක් එක් ප්‍රශ්නයෙහි නාම /ප්‍රකාශන/ දින වකවානු සමූහයක් X හා Y තීරුවල දී ඇත. Y තීරුවේ දී ඇති නාම /ප්‍රකාශන/දින වකවානු X තීරුවේ ඇති ඒවා සමග කිසියම් ආකාරයකට ගැළපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙලට නොවේ. Y තීරුව X තීරුව සමග ගැළපෙන අනුපිළිවෙලට සකස් කළ විට පහත දී ඇති සංයෝග එහෙන් එකක් නිවැරදිය. නිවැරදි සංයෝගයට අයත් අංකය තෝරා වරහන තුළ ලියන්න.

16)

| X | Y |
|---|---|
| (i) පණ්ඩුවාසුදේව | A සෝමාදේවි |
| (ii) කාකවණ්ණතිස්ස | B වෙන්කට රංගම්මාල් |
| (iii) වට්ටගාමිණී අභය | C භද්දකච්චානා |
| (iv) නිශ්ශංකමල්ල | D විහාරමහාදේවි |
| (v) ශ්‍රී වික්‍රම රාජසිංහ | E කල්‍යාණවතී |

(1) BDABC (2) DEACB (3) CBDAE
(4) CDAEB (5) BEADC

(.................)

| | X | | Y |
|---|---|---|---|
| 17) | (i) දුටුගැමුණු | | A රවිදේව |
| | (ii) වට්ටගාමිණීඅභය | | B කපිසීස |
| | (iii) ධාතුසේන | | C නන්දිමිත්‍ර |
| | (iv) I විජයබාහු | | D මිගාර |
| | (v) I පරාක්‍රමබාහු | | E ලංකාපුර |

(1) EDABC (2) DEACB (3) CBDAE
(4) CDAEB (5) BEADC (..................)

| | X | | Y |
|---|---|---|---|
| 18) | (i) මහබද්ද | | A අලි ඇතුන් පිළිබඳ කාර්යාංශය |
| | (ii) කොට්ටල් බද්ද | | B විවීම පිළිබඳ කාර්යාංශය |
| | (iii) කුරුවේ බද්ද | | C ප්‍රවාහන කාර්යාංශය |
| | (iv) මඩිගේ බද්ද | | D කුරුඳු දෙපාර්තමේන්තුව |
| | (v) කින්නර බද්ද | | E ශිල්පීන් පිළිබඳ කාර්යාංශය |

(1) EDABC (2) DEACB (3) CBDAE
(4) CDAEB (5) BEADC (..................)

| | X | | Y |
|---|---|---|---|
| 19) | (i) සිල්වත් සමාගම | | A එච්.එස්.ඕල්කට් |
| | (ii) සයිව ප්‍රකාශ සංඛයි | | B වැලිවිට ශ්‍රී සරණංකර හිමි |
| | (iii) බෞද්ධ පරමවිඥානාර්ථ සමාගම | | C ඩී.බී.ජයතිලක |
| | (iv) මහාබෝධි සමාගම | | D අනගාරික ධර්මපාල |
| | (v) තරුණ බෞද්ධ සංගමය | | E අරුමුග නාවලර් |

(1) EDABC (2) DEACB (3) CBDAE
(4) CDAEB (5) BEADC (..................)

| | X | | Y |
|---|---|---|---|
| 20) | (i) එඩ්වඩ් බාන්ස් | | A කොළඹ කෞතුකාගාරය පිහිටුවීම |
| | (ii) හර්කියුලිස් රොබින්සන් | | B යුනිවසිටි කොලිජිය පිහිටුවීම |
| | (iii) විලියම් ගෙගරි | | C කොළඹ- නුවර මාර්ගය ඉදිකිරීම |
| | (iv) හෙන්රි මැකලම් | | D මහනගර සභා පිහිටුවීම |
| | (v) විලියම් මැනිං | | E කෘෂිකර්ම දෙපාර්තමේන්තුව පිහිටුවීම |

(1) EDABC (2) DEACB (3) CBDAE
(4) CDAEB (5) BEADC (..................)

අංක 21 - 25 තෙක් සෑම ප්‍රශ්නයකටම නිවැරදි පිළිතුර තෝරා එහි අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.

21) හෙළ අටුවා පාලි භාෂාවට රචනා කළ බුද්ධඝෝෂ හිමි මෙරටට වැඩම කරන විට සිටි පාලකයා වූයේ,

1. මහසෙන් රජුය
2. ධාතුසේන රජුය
3. මහානාම රජුය

4. මානවම්ම රජුය
5. මිත්සෙන් රජුය (..................)

22) ගඩලාදෙනිය, අම්බැක්කේ හා ලංකාතිලක යන පූජනීය ස්ථාන ගොඩනගන ලද්දේ,
1. iV බුවනෙකබාහු රජුය
2. iV පරාක්‍රමබාහු රජුය
3. ii පරාක්‍රමබාහු රජුය
4. iii වික්‍රමබාහු රජුය
5. iii බුවනෙකබාහු රජුය (..................)

23) වෙංගෝ නමැති චීන සෙන්පතියා විසින් චීනයට අල්ලා ගෙන ගිය රයිගම පාලකයා කවරෙක්ද?
1. සකලකලාවල්ලභ
2. දේව මන්ත්‍රී
3. සේනාධිලංකාර
4. වීර අලකේශ්වර
5. අම්බුළුගල (..................)

24) ලන්දේසීන් යටතේ පැවති බලකොටුවල පාලනය භාරව සිටි නිලධාරියා වූයේ,
1. සුපරින්ටෙන්ඩන්ට්
2. ඔපර්හුෆ්ට්
3. විසූරේ
4. උවිදෝර්
5. කොමාන්ඩර් (..................)

25) 1644 උඩරට රජුට එරෙහිව ඇති වූ කැරැල්ලේ නායකයා වූයේ,
1. ඒදඬුවාවේ රාළ
2. එට්ටිය බණ්ඩාර
3. අඹන්වෙල රාළ
4. ඇල්ලෙපොල
5. දස්කොන් (..................)

අංක 26 - 30 තෙක් සෑම ප්‍රශ්නයකටම එක් මාතෘකාවක් යටතේ කරුණු පහ බැගින් සපයා ඇත. එම කරුණු අතුරෙන් එකක් අදාළ මාතෘකාවට නොගැළපේ. එය තෝරා, ඊට අදාළ අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.

26) ලන්දේසි ආර්ථික ප්‍රතිපත්ති
1. මුතුරාජවෙල ඇස්වැද්දීම
2. හැමිල්ටන් ඇළමාර්ග ඉදිකිරීම
3. බදු අයකිරීම ක්‍රමවත් කිරීමට තෝම්බු සැකසීම
4. දේශපාලන අධිකාරිය විසින් ආර්ථික කටයුතු මෙහෙයවීම
5. උක්, ඉන්ඩිගෝ,කපු වැනි දෑ වගාකොට සීනි නිපදවීම (..................)

27) දෙවැනි විමලධර්මසූරිය රජතුමා,

1. දෙවෙනි රාජසිංහ රජුගේ පුත්‍රයාවේ
2. ලන්දේසි තර්ජන මැඩ පවත්වමින් ඔවුන් සමග සාමකාමීව කටයුතු කිරීම
3. හුරුමයෙන් උපසම්පදා භික්ෂූන් වැඩමවා උපසම්පදාව යළි නගා සිටුවීමට උත්සාහ කිරීම
4. කාර්යක්ෂම පාලකයකු නිසා උඩරට ප්‍රභූ බලය වර්ධනය වීම
5. කපු වගාව දියුණු කිරීම (..................)

28) දෙවැනි විමලධර්මසූරිය රජතුමා,

1. ඌව වෙල්ලස්ස ප්‍රදේශයෙන් ආරම්භ වීම
2. අරගලයෙන් පසු ජෝන් ඩොයිලි මහනුවර ආණ්ඩුවේ ඒජන්තවරයා වීම
3. හජ්ජි මරික්කාර් මඩිගේ මුහන්දිරම් ලෙස පත් කරනු ලැබීම අරගලය ඇතිවීමට හේතු විය
4. කැප්පෙටිපොළ දිසාව අරගලයේ ප්‍රධාන නායකයකු වීම
5. අරගලයේ නායකයන් බ්‍රිතාන්‍ය ආණ්ඩුවේ ද්‍රෝහීන් ලෙස ප්‍රකාශයට පත් කරනු ලැබීය

(..................)

29) බ්‍රිතාන්‍යයන් යටතේ වතු ආර්ථිකය,

1. කෝල්බෲක් කැමරන් ප්‍රතිසංස්කරණ වතු ආර්ථිකයේ වර්ධනයට මග පෑදිය
2. 1880 තෙක් වඩාත්ම වැදගත් වාණිජ බෝගය වූයේ කෝපිය
3. හෙන්රි වෝඩ් විසින් පළමුවැනි කෝපි වත්ත ආරම්භ කරනු ලැබීය
4. වතු වගාවේ නැගීම ප්‍රවාහන පද්ධතියේ වර්ධනයක් ඇති වීමට හේතු විය
5. වතු වගාව ප්‍රධාන වශයෙන් සංක්‍රමණික ශ්‍රමය මත පදනම් විය (..................)

30) මුහුදුබඩ පළාත්වල ලන්දේසි පාලනය,

1. රෙපරමාදු ආගම හඳුන්වා දීම
2. මුල්ලේරියා සටනින් පරාජයට පත්වීම
3. මුද්‍රණ යන්ත්‍රය හඳුන්වා දීම
4. දෙමළ ජනයාගේ නීති හා සම්ප්‍රදායයන් තේසවලමේ නීති සංග්‍රහ ගත කිරීම
5. ලැන්ඩ් රාද් උසාවි පිහිටුවීම (..................)

අංක **31** සිට **35** තෙක් එක් එක් ප්‍රශ්නයට දක්වා ඇති (A), (B), (C) හා (D) යන ප්‍රතිචාර හතර අතුරෙන් එකක් හෝ කිහිපයක් හෝ නිවැරදිය. නිවැරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර හෝ තෝරා,

(A) සහ (B) පමණක් නිවැරදි නම් ...................................... **1** ද,
(B) සහ (C) පමණක් නිවැරදි නම් ...................................... **2** ද,
(C) සහ (D) පමණක් නිවැරදි නම් ...................................... **3** ද,
(A) සහ (C පමණක් නිවැරදි නම් ...................................... **4** ද,
ප්‍රතිචාර එකක් හෝ දෙකකට වැඩි සංඛ්‍යාවක් හෝ නිවැරදි නම් .................................. **5** ද, වරහන තුළ ලියන්න.

| උපදෙස් සම්පිණ්ඩනය | | | | |
|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 |
| (A) සහ (B) පමණක් නිවැරදිය | (B) සහ (C) පමණක් නිවැරදිය | C) සහ (D) පමණක් නිවැරදිය | (A) සහ (C පමණක් නිවැරදිය | ප්‍රතිචාර එකක් හෝ දෙකකට වැඩි සංඛ්‍යාවක් හෝ නිවැරදිය |

31) ඩොනමෝර් ප්‍රතිසංස්කරණ සම්බන්ධයෙන් කුමන පහත ප්‍රකාශ නිවැරදිද?

A) කැබිනට් ක්‍රමය හඳුන්වා දීම
B) රාජ්‍ය මන්ත්‍රණ සභාව
C) සර්වජන ඡන්ද බලය හඳුන්වා දීම
D) රාජකාරි ක්‍රමය අවලංගු කිරීම (..................)

32) 1890 වන විට තේ වගාව ව්‍යාප්ත වීමට බලපෑ හේතු.

A) ලනඩන් වෙළඳපොළේ තේ මිල ඉහළ යෑම
B) පොහොර භාවිතය වැඩිවීම
C) කොළඹ වරාය දියුණු වීම
D) දකුණු ඉන්දියානු ශ්‍රමිකයන් ගෙන ඒම නිසා ශ්‍රමය පහසුවෙන් ලබාගත හැකිවීම
(..................)

33) ලන්දේසි ආගමික ප්‍රතිපත්තිය.

A) ඉස්කෝල ආරම්භ කර ඒවා ආගම් ප්‍රචාරයට ඉවහල් කර ගැනීම
B) යුරෝපීය දරුවන් සඳහා කොළඹ සෙමනේරිය වැනි වෙනම පාසල් ආරම්භ කිරීම
C) ෆ්‍රැන්සිස්කන් ඩොමිනිකන් වැනි මිෂනාරි සමාගම් විසින් ආගම් ප්‍රචාරය සිදු කිරීම
D) එස්පිරිටල් නමින් හැඳින්වූ කුඩා ආරෝග්‍යශාලා ආරම්භ කිරීම (..................)

34) ලක්දිව බුද්ධාගමේ විකාශනය සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේද?

A) දේවානම්පියතිස්ස රජුගේ පාලන සමයේදී භික්ෂු භික්ෂුණී ශාසන පිහිටුවීම
B) වට්ටගාමිණී රජුගේ රාජ්‍ය කාලයේදී ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීම
C) සිරිමෙවන් රජුගේ පාලන සමයේදී දන්ත ධාතූන් වහන්සේ වැඩම කිරීම
D) මහා පරාක්‍රමබාහු රජුගේ රාජ්‍ය සමයේදී ත්‍රෛනිකාය සමගි කිරීම (..................)

35) පළමුවන විජයබාහු රජුගේ කාර්ය සංසිද්ධීන් පිළිබඳව පහත දැක්වෙන කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේද?

A) චෝල ආධිපත්‍යයෙන් ශ්‍රී ලංකාව නිදහස් කර ගැනීම
B) රජකම ලැබීමට පෙර ඔහු ගතකළ ජීවිතය පිළිබඳව ලුහුඬු විස්තරයක් පනාකඩුව තඹ සන්නසෙහි සඳහන් වීම
C) තෝපා වැව ඉදි කිරීම
D) චීනය සමග මිත්‍ර සම්බන්ධතා පැවැත්වීම (..................)

අංක **36** සිට 40 තෙක් ප්‍රශ්න වලට අදාළව ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින්ම ගැළපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන 1,**2**,**3**,4 හා **5** යන කවර ප්‍රකාශ යුගලයදැයි තෝරා ඊට අදාළ අංකය වරහන තුළ ලියන්න.

| | පළමුවන ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| 1 | නිවැරදිය | නිවැරදිය |
| 2 | නිවැරදිය | වැරදිය |
| **3** | වැරදිය | වැරදිය |
| 4 | වැරදිය | නිවැරදිය |
| **5** | නිවැරදිය | නිවැරදි වන අතර පළමුවැන්න මැනවින් පහදා දෙයි |

| පළමුවැනි ප්‍රකාශය | දෙවන ප්‍රකාශය | |
|---|---|---|
| **36)** විජයබා කොල්ලයෙන් පසු සීතාවක බලයට පත් වූයේ මායාදුන්නේ රජුය | සීතාවක බලයට පත් මායාදුන්නේ රජු පෘතුගීසි විරෝධී රජ කෙනෙකි | (..................) |
| **37)** පළමුවැනි විමලධර්මසූරිය රජු දෙල්ගමුවේ දළදා මාලිගාවක් කරවිය | කීර්ති ශ්‍රී රජසිංහ මහනුවර වාර්ෂික දළදා පෙරහර අඛණ්ඩව පැවැත්වීම | (..................) |
| **38)** ලන්දේසි පාලන සමය තුළ උඩරට රාජ්‍ය සමග ඉංග්‍රීසි දූත සබඳතා සිදු විය | ජෝන් පයිබස්, හියු බොයිඩ්, රොබට් ඇන්ඩෲස් එසේ පැමිණි ඉංග්‍රීසි දූතයන් වේ | (..................) |
| **39)** 1818 නිදහස් සටන ඇතිවීම වෙල්ලස්ස ප්‍රදේශයෙන් සිදුවීම | 1818 නිදහස් සටන ඇතිවීමට ආසන්නතම හේතුව ටොරිංටන් සාමිගේ බදු ප්‍රතිපත්තියයි | (..................) |
| **40)** ප්‍රථමවරට සීමිත ඡන්දය හඳුන්වා දීම කෲම් මැකලම් ප්‍රතිසංස්කරණවල ප්‍රතිඵලයකි | පළාත්බද ඡන්ද ක්‍රමය හඳුන්වා දෙන ලද්දේ මැනිං-ඩෙවොනෂයර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ මගිනි | (..................) |

## (25) ශ්‍රී ලංකා ඉතිහාසය

(... අතීතයේ සිට ක්‍රි.ව. 1975 දක්වා)

II පත්‍රය

1.

